**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2018**

**----------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව

උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රමිතයෙහි 40 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේදී පොලී ලැබීම් වලින් වන මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කල යුතුය. නමුත් ආයතනය විසින් ආදායම් ප්‍රකාශය තුල නිරූපණය කර තිබූ සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.10,404,473 ක් වන අතර එම ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට ගලපා වර්ෂය තුල මුදලින් ලද ප්‍රමාණය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ නිරූපණය කර නොතිබුණි. | ආයතනය විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේ දි විගණනයේ පෙන්වා දි ඇති ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංකයන්ට අනුකූලව ඉදිරි වර්ෂයේ දි ඉදිරිපත් කිරීමට එකගවන අතර ඒ සම්බන්ධයෙන් ආයතනයේ ගණකාධිකාරිවරයාහට උපදෙස් දෙන ලදි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව හා එහි දක්වා ඇති නිශ්චිත මගපෙන්වීම්වලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමට ආයතනය කටයුතු කල යුතුවීම. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව වත්කම් මිලදී ගෙන ඒවා ප්‍රයෝජනයට ගන්නා දින සිට ක්ෂය කිරීම් කළ යුතු වුවත් ආයතනය විසින් වත්කම් මිලට ගත් වර්ෂය සඳහාම ක්ෂය කිරීම් කර තිබුණි. එසේම 2018 දෙසැම්බර් 31 දිනට ලියාහල අගය රු.21,610,143 ක් වූ ගොඩනැගිලි සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂයවීම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. එසේම, සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් භාවිතයට ගනිමින් පැවති පිරිවැය රු.6,519,777 ක් වූ වත්කම් අයිතම 34 ක් නැවත ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | විගණනයේ දක්වා ඇති කරුණු පැහැදිලිනොමැත. උදාහරණයක් මගින් කරුණු ඉදිරිපත් කරන්නේනම් පැහැදිලි කිරිමක් කල හැකිය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල මගපෙන්වීම් වලට අනුව ආයතනය ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කල යුතුවීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආයතනය විසින් වර්ෂයේ පොලී ආදායම රු.138,543 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, ස්ථාවර තැන්පත් හා ණයගැති ශේෂයන්ට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අගයන් හා ඊට අදාල උපයෝගී ලියවිලි අතර රු.731,415 ක වෙනසක් තිබුණි. | 2018 වර්ෂයේදි පොලි ආදායම රුපියල් 138,543 ක මුදලක් වැඩියෙන් සටහන්ව ඇති බව විගණන නිරික්ෂණය සමග එකගවන අතර එය 2019 වර්ෂයේ දි පෙර වර්ෂ ගැලපුමක් ලෙස 2018 ගිණුම් වලින් නිවැරදි කර ගැනිමට සටහන් කර ගතිමි. | ආයතනය විසින් වර්ෂයේ පොලී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතුවීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 3(1)(ග) වගන්තිය | වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිත පිහිටුවීම සිදුකල යුතු වුවද ආයතනය පිහිටුවා වසර 09 ක කාලයක් ගතවුවද විගණිත දිනය වන විටත් එම කටයුත්ත සාර්ථකව සිදුකර නොතිබුණි. | ප්‍රමිත පිහිටුවීම සඳහා ආයතනය 2018 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක වූ අතර පසුව ගරු කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී මෙම ප්‍රමිත සෑදීම සඳහා කමිටුවක් නිර්දේශ කෙරුණු නමුත් මේ වන තෙක් අදාල කාර්යය සඳහා කමිටු රැස්වීමක් කැඳවා නොමැති අතර එවන් අවස්ථාවකදී ආයතනික වශයෙන් මෙම ප්‍රමිත පිහිටුවීමට සියලු තාක්ෂණික කරුණු ලබාදීමට කැමැත්තෙන් සිටින බව දන්වා ඇත. | ශ්‍රී ලංකාව තුල වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ ජනතා ප්‍රමිත නොමැතිවීම ගැටලුකාරී තත්වයක් වී ඇති බැවින් ඒ සඳහා කඩිනම් හා ස්ථිර වැඩපිළිවෙලක් යටතේ ශ්‍රී ලංකාව තුල ජාතික ප්‍රමිත ස්ථාපිත කිරීම කල යුතුවීම. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 හා 3 ඡේද | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන් හඳුනාගෙන නොතිබුණි. | මානව සම්පත් සැලැස්මක් ඇති අතර මේ වන විටත් කාර්ය මණ්ඩල සඳහා පුහුණු අවස්ථාවක් 2018 වර්ෂය තුල ලබාදී ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය සිදුකිරීමට ආයතනය වගබලා ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 21,506,251 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 18,534,446 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,971,805 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම රු.2,840,448 කින් ඉහළයාම හා භාණ්ඩාගාර ප්‍රධාන රු. 1,957,772 ක් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මට අනුව, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩසටහන් 02 ක් පැවැත්වීම තුලින් රු. 315,000 ක ආදායමක් උපයා ගැනීමට සැලසුම් කර තිබුණද සත්‍ය ලෙස වැඩසටහන් 01 ක් පමණක් පවත්වා රු. 84,000 ක ආදායමක් ලබා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි වැඩසටහන් දෙකක් සඳහා සැලසුම් කලද ආයතනවල ඉල්ලීමට අනුව එක් වැඩසටහනක් පමණක් සිදු කෙරිනි. | ක්‍රියාකාරී සැලැස්ම තුල නිශ්චිතව දක්වා ඇති කරුණු ඉටු කිරීමට කාර්යක්ෂම ආර්ථික වශයෙන් ලාභදායී හා ඵලදායී ක්‍රමවේදයක් ස්ථාපිත කර පවත්වාගත යුතුය.- |

### 3.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ | ජාතික වෘත්තීය සුරක්ෂිත හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ආයතනය විසින් තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රයට අනුකූලව කටයුතු කල යුතුය. |

ආයතනය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න දැනුවත් වී නොතිබුණි. එම නිසා එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ලඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයක්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.